## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

*වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය*

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2011

2013 දෙසැම්බර්

## BMGT E3025 – කුඩා ව්‍යාපාර කළමනාකරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

01. (අ) "ගුණවර්ධන මහතා ඇඟලුම් කම්හලක අයිතිකරු වෙති. සේවකයෝ 17 දෙනෙකු ඔහු සමඟ සේවය කරමින් සිටිති. ඔහු සිතනුයේ ඔහුගේ ව්‍යාපාරය කුඩා පරිමාණ එකක් බවයි". ඔහුගේ අදහස පිළිබඳව ඔබ සිතනුයේ කුමක්ද? විස්තරාත්මකව පහදන්න.

(ලකුණු 06)

(ආ) "කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශ්‍රී ලංකාව වැනි රටකට බෙහෙවින් වැදගත් නොවේ". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහිද? විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 08)

(ඇ) ශ්‍රී ලංකාව තුළ, කුඩා ව්‍යාපාර සම්බන්ධයෙන් ඉහළ අසමාර්ථ අනුපාතයක් ඇති වීමට හේතු විස්තර කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

02. (අ) "ව්‍යාපාර ලෝකය තුළ විවිධ වර්ගයේ ව්‍යවසායකයෝ සිටිති". ඔවුන්ව හඳුනාගෙන විස්තර කරන්න.

(ලකුණු 04)

(ආ) "සාර්ථක ව්‍යවසායකයකු වීමටනම් ඔහුගේ පෞරුෂය යම් මූලික ගුණාංග වලින් යුක්ත විය යුතුය." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහිද? විස්තරාත්මකව පහදන්න.

(ලකුණු 08)

(ඇ) ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රය යනු කුමක්ද? ව්‍යාපාරික ලෝකය තුළ ව්‍යවසායකත්ව සංවර්ධනය වැඩි කිරීම උදෙසා එහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

03. (අ) ව්‍යාපාරික පරිසරයේ ප්‍රධාන උපාංග මොනවාද? පහදන්න.

(ලකුණු 05)

(ආ) පහතින් දක්වා ඇත්තේ සාර්ව ව්‍යාපාරික පරිසරයේ උපාංග වේ. මේවා කුඩා ව්‍යාපාරිකයන්ට වැදගත් වන්නේ කෙසේදැයි විස්තරාත්මකව විස්තාරණය කරන්න.

i. ජන විද්‍යාව (Demography)

ii. ආර්ථික පරිසරය

ii. දේශපාලන පරිසරය

iv. සමාජ සංස්කෘතික පරිසරය

iv. ස්වභාවික පරිසරය

(ලකුණු 15)

(මුළු ලකුණු 20)

04. (අ) නව ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීමේ මාර්ග මොනවාද?

(ලකුණු 04)

(ආ) ඔබ නව කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සූදානම් වන්නේයැයි සිතන්න. මෙහිදී සලකා බැලිය යුතු සාධක මොනවාදැයි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 16)

(මුළු ලකුණු 20)

05. (අ) ව්‍යාපෘති වාර්තාවක් පිළියෙළ කිරීමේ අරමුණු හඳුනාගන්න. පහදන්න.

(ලකුණු 03)

(ආ) ව්‍යාපෘති වාර්තාවක් පිළියෙළ කිරීමට භාවිතා වන අලෙවි ශක්‍යතාවය හා තාක්ෂණික ශක්‍යතාවයෙහි වැදගත්කම නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ඇ) යෝජිත කුඩා ව්‍යාපාරයක් සඳහා සුදුසු උපකල්පන භාවිතා කරමින් ව්‍යාපෘති වාර්තාවක් සකස් කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) සමාජ සංවර්ධන ආකෘතිය (Social Development Model)

(ආ) නිර්මාපකයා (Innovator)

(ඇ) සමාජ ව්‍යවසායකත්වය (Social Entrepreneurship)

(ඉ) අවදානම් දරන්න (Risk Taker)

(ඊ) සමාජ වගකීම (Social Responsibility)

(5x4 = 20)